# දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

## රජයේ ඉඩම් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම.

## පදිංචිය සඳහා දීර්ඝකාලීන බදු ක්‍රමයට ඉඩමක් ලබා ගැනීම.


ප්‍රධාන කාර්යාලය

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
අංක 211, වක්වැල්ල පාර, ගාල්ල. දුරකථන: 091 2234266

දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල.

අංක 211, වක්වැල්ල පාර, ගාල්ල. දුරකථන: 091 2235802

දිස්ත්‍රික් කාර්යාලය, මාතර.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය
කොටුව, මාතර. දුරකථන: 041 2233478

දිස්ත්‍රික් කාර්යාලය, හම්බන්තොට.

දෙවන මහල මාගම් රුහුණු පරිපාලන සංකීර්ණය
සිරිබෝපුර, හම්බන්තොට. දුරකථන: 047 2256461

වෙබ් අඩවිය: www.landsp.lk


## පදිංචිය සඳහා දීර්ඝකාලීන බදු ක්‍රමයට ඉඩමක් ලබා ගැනීම.

### ඔබ කළයුතු දේ,.(සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා)

- රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා සුදුස්සන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයේ ලියාපදිංචි වීම.
- ඉඩම් කච්චේරි වැඩ සටහනට ඉදිරිපත් වීම.
- අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් කොටසක් ඇත්නම් එම ඉඩම සඳහාද ,නව ඉඩම් බෙදා දීමකදී එම ඉඩම් කොටසටද, තෝරා ගැනීම සිදු කරනු ඇත.
- තෝරා ගත් ඉඩම් ලාභියෙකු එම ඉඩම සඳහා දීර්ඝකාලීන බදුකරයක් ලබා ගැනීම සඳහා පහත ලේඛන ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය.
  - අයදුම්කරුගේ ඉල්ලීම් ලිපිය
  - 17 වන පරිශිෂ්ට දිවුරුම් ප්‍රකාශය
  - බදු මුදල් ගෙවන බවට වූ දිවුරුම් ප්‍රකාශය (ඉඩම් කොමසාරිස්ගේ 2009/05)
  - ජාතික හැඳුනුම්පත් පිටපත

**ප්‍රාදේශීය ලේකම් සකස් කරන ලේඛන**

- 19 පරිශිෂ්ටය
- තත්ත්ව වාර්තාව
- පිඹුර හා කැබලි අංක විස්තරය/දළ අනුරේඛනය
- ඉඩම් කළමණාකරන ආකෘතිය
- පළාත් පාලන ආයතන එකඟතාවය

### පදිංචිය සඳහා දීර්ඝකාලීන බදුකරයන් සකස් කල යුතු අවස්ථා

ආදායම් කාණ්ඩ ගැසට් නිවේදනය පරිදි යම් පුද්ගලයෙකුගේ අවිවාහක දරුවන්ද ඇතුළුව පවුලේ වාර්ෂික ආදායම් විවාහක රුපියල් ලක්ෂ 05 (5,00,000/-) ක් හෝ අවිවාහක හාර ලක්ෂ අසූ දහසක් (4,80,000/-) ඉක්මවන පුද්ගලයෙකු වෙත රජයේ ඉඩමක් ලබාදිය යුත්තේ රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදුකර වර්ග 03න් ඉඩම ලබාදීමේ අරමුණ අනුව වෙන් වෙන් කොන්දේසි යටතේ සකස් කෙරේ.


1. නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීන බදුකර
2. කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදුකර
3. වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදුකර

### දීර්ඝකාලීන බදුකරයක් ලබා ගැනීමෙන් ඔබට ලැබෙන වාසි

- රජයේ ඉඩම සඳහා නීත්‍යානුකූල හිමිකම
- ස්ථිර නිවසක් ඉදිකිරීමට හා ඉඩම සංවර්ධනය කිරීමට අවසරය ලැබීම.
- ඔබගේ කාලත්‍රයාට/ දරුවන්ට ඉඩමෙහි හිමිකම් පවරා දීමට හැකියාව ලැබීම.
- පිළිගත් මූල්‍ය ආයතනයකට හෝ බැංකුවකට උකස් කර ණය මුදලක් ලබාගැනීමට හැකියාව ලැබීම.
- අදාල ඉඩම අතුරු බදුදීමට හෝ වෙනත් අයෙකුට පවරා දීමට හැකියාව ලැබීම.
- දීර්ඝකාලීන බදුකර ඉඩමෙහි ස්ථිර නිවසක් තනා පදිංචිව ඉඩම හොඳින් සංවර්ධනය කර ඇති විට හා දීර්ඝකාලීන බදුකරය නිකුත් කර වසර 5 ක් ගත වූ විට එම ඉඩම සඳහා නිදහස් දීමනාපත්‍රයක් ලබාගැනීමට හැකියාව ඇත.
- වසර 30ක දීර්ඝ කාලසීමාවක් සඳහා ලබාදීම
- අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සහිතව නිකුත් වන විධිමත් ලියවිල්ල.



# දීර්ඝකාලීන බදුකරයකට අදාලව ක්‍රියාත්මක වන වැඩ පියවර




01. ඉල්ලීම් ලිපිය
02. නිර්දේශිත වාර්තාව
03. නිර්දේශිත වාර්තාව
04. නිර්දේශිත වාර්තාව
05. දීර්ඝකාලීන බදු අනුමැතිය
06. දීර්ඝකාලීන බදු අනුමැතිය
07. දීර්ඝකාලීන බදු අනුමැතිය
08. මැනුම් ඉල්ලීම
09. මැනුම් ගාස්තු ගෙවීම
10. මැනුම් කිරීම
11. මැනුම් වාර්තා ලැබීම
12. තක්සේරු වාර්තාව ඉල්ලීම
13. තක්සේරු වාර්තාව ලැබීම
14. බදු මුදල් ගෙවීමට දැනුම් දීම
15. බදු මුදල් ගෙවීම
16. බදු ගෙවීම් වාර්තා කිරීම
17. බදු ගෙවීම් වාර්තා කිරීම
18. බදුකර කෙටුම්පත ලැබීම
19. කෙටුම්පතට පුද්ගල අත්සන ලබාගැනීම
20. පුද්ගලයාගේ අත්සන සහිත කෙටුම්පත ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීම
21. අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනට යොමු කිරීම
22. අතිගරු ජනාධිපතිතුමන්ගේ අත්සනින් බදුකරය ලැබීම
23. අතිගරු ජනාධිපතිතුමන්ගේ අත්සනින් දීර්ඝකාලීන බදුකරය ලැබීම
24. දීර්ඝකාලීන බදුකරය ලියාපදිංචිය සඳහා යැවීම
25. ලියාපදිංචි වී ලැබීම
26. දීර්ඝකාලීන බදුකරය පුද්ගලයාට නිකුත් කිරීම.